# ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය - 2021

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ ("යෝජනා ක්‍රමය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී, මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමය විසින් යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයන් සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව යෝජනා ක්‍රමය කටයුතු කර ඇති බව; සහ

- යෝජනා ක්‍රමයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 16.5 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අලාභය රු. බිලියන 11.3 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. බිලියන 27.8 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් අඩු වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 අගෝස්තු 6 දිනැති හා එදින සිට ක්‍රියාත්මක වන 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසිවල 4.1 වගන්තිය ප්‍රකාරව, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක්ම මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයෙක් විය යුතුය. කෙසේ වෙතත්, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරවල නියුක්තවන බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මෙම රෙගුලාසි යටතේ ආවරණය නොවේ. එබැවින්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් යෝජනා ක්‍රමයේ සාමාජික ආයතනවීම අවශ්‍ය නොවේ. මුදල් මණ්ඩලය විසින් බලපත්‍රය අවලංගු කළ විටකදී එවැනි ආයතනවල තැන්පත්කරුවන්ට වන්දි සඳහා හිමිකම්පෑමට හිමිකමක් නොමැත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද තොරතුරුවලට අනුව, 2021 ජුනි 30 වන විට සමාගම් 4 ක් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ලෙස බලපත්‍ර ලබාගෙන ඇත. | 2019 මාර්තු 6 දින "තැන්පතු" මැයෙන් නිකුත් කරන ලද 2019 අංක 1 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත් විධානයට අනුව, සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක්ම, ඇපකර තැන්පතු ලෙස පමණක් තැන්පත් බාර ගත යුතුය. තවද, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සෑම විටම ශුද්ධ ණය දෙන්නෙකු විය යුතු අතර එම සමාගම්වල මුළු තැන්පතු ප්‍රමාණය, එහි ක්‍රියාකාරී ණය හා අත්තිකාරම්වලින් සියයට 60 ට වඩා නොවිය යුතුය. ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක පාරිභෝගිකයෙක් එම සමාගමකින් ලබාගත් ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පූර්ණයෙන් ම ගෙවා ඇත්නම්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම එම ගෙවීම් දින සිට මාස 6 කට වඩා ඇපකර තැන්පතු තබා නොගත යුතු බවද ඉහත විධානයේ වැඩිදුරටත් දැක්වේ. ඒ අනුව, පොදුවේ, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල එම තැන්පත්කරුවන් ශුද්ධ ණය ගන්නන් වේ. මෙම තත්වයන් යටතේ, මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ට සැපයිය යුතු යැයි අපේක්ෂා කරන ආරක්ෂාව, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලට සමානවම අදාල කළ නොහැකිය. එබැවින්, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට අදාලව දැනට පවතින රෙගුලාසි මඟින් එම සමාගම් වර්ගය ආවරණය නොවේ. | යෝජනා ක්‍රමයේ සාමාජිකයන් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ඇතුළත් කර ගැනීමේ හැකියාව සලකා බැලීම අවශ්‍ය වේ. |

**3.2 සාමාජික ආයතනවලට ණය ප්‍රදානය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රම රෙගුලාසිවල 8.1 (ii) වගන්තිය ප්‍රකාරව, කිසියම් සාමාජික ආයතනයක දැඩි ද්‍රවශීලතා අර්බුදයක් පවතින විටදී එවැනි සාමාජික ආයතනයකට සුරක්‍ෂිත අත්තිකාරම් හෝ ණය ලබා දෙනු ලැබේ. ඒ අනුව, 2014 දෙසැම්බර් 15 වන දින සාමාජික ආයතනයකට රු. බිලියන 6 ක ණයක් ලබා දී ඇත. සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු ණය මුදල රු. බිලියන 1.47 ක් විය. මුදල් ව්‍යාපාරය කරගෙන යාම සඳහා එම සාමාජික ආයතනය වෙත නිකුත් කළ බලපත්‍රය 2020 මැයි 22 දින සිට බලාත්මක වන පරිදි මුදල් මණ්ඩලය විසින් අවලංගු කරන ලදී. 2021 දෙසැම්බර් 31 අවසන්වන විට මෙම ණයට අදාලව රු. මිලියන 1,095 ක හානිකරණ වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. | අදහස් දක්වා නැත. | හිඟ ණය ශේෂය අය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. |

**3.3 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| යෝජනා ක්‍රමය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ රු. මිලියන 147.05 ක මුදලකට 2016 මාර්තු 31 දිනට කල් පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක රු. මිලියන 137.18 ක මුදලක් 2015 අප්‍රේල් 01 දින ආයෝජනය කර තිබුණි. ප්‍රාථමික අලෙවිකරු විසින් ඉහත ආයෝජනය සඳහා පාදක වූ සුරැකුම්පත්, ඒ වෙනුවෙන් කිසිදු සුරැකුම්පතක් ආදේශ නොකර ඉවත් කර ගෙන තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් ආයෝජනය සඳහා රු. මිලියන 144.25 ක් වූ හානිකරණයක් 2015 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. | අදහස් දක්වා නැත. | අනාගතයේදී එවැනි අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

**3.4 අරමුදලෙන් ගෙවීම් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසිවල 9.10 වගන්තිය ප්‍රකාරව, 2012 ජනවාරි 01 දින හෝ ඊට පසුව මුදල් මණ්ඩලය විසින් අත්හිටුවීම / අවලංගු කිරීම පිළිබඳව නියෝග කර ඇති විටකදී වන්දි ගෙවීම බලාත්මක වේ. ඒ අනුව, 2018, 2019 සහ 2020 යන වර්ෂයන් තුළදී සාමාජික ආයතන හයක බලපත්‍ර මුදල් මණ්ඩලය විසින් අවලංගු / අත්හිටුවීම කරන ලදී. 2021.03.19 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ලද පුවත්පත් නිවේදනය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල බලපත්‍ර අවලංගුකිරීම හෝ අත්හිටුවීම කළ අවස්ථාවලදී එම ආයතනවල තැන්පත්කරුවන්ට උපරිම සහන | අදහස් දක්වා නැත. | සුදුසු තැන්පත්කරුවන්ට වන්දිගෙවීම සම්පූර්ණ කිරීම. |

සැලසීමේ අරමුණෙන් යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන උපරිම වන්දි මුදල රු.600,000 සිට රු.1,100,000 දක්වා රු.500,000 කින් ඉහළ දැමීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කරන ලදි. ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කළ මූල්‍ය සමාගම් 6 ක තැන්පත්කරුවන්ට ගෙවිය යුතු මුළු වන්දි මුදල රු. මිලියන 35,243 ක් වූ අතර ඉන් රු.බිලියන 29,242 ක් හෙවත් සියයට 83 ක් 2021.12.31 වන විට යෝජනා ක්‍රමයෙන් ගෙවා තිබුණි.

## 3.5 රක්ෂණය කෙරෙන තැන්පතු මත ගෙවිය යුතු වාරික මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් මාසය අවසානයට ඇති සියලු සුදුසුකම්ලත් මුළු තැන්පතු මත වාර්ෂිකව සියයට 0.15 ක අනුපාතට මාසිකව ගණනය කර වාරික මුදල් ගෙවිය යුතුය. 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසිවලද මූල්‍ය සමාගම් සඳහා සමාන ප්‍රතිශතයක් ඇතුළත් විය. මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු/ අත්හිටුවන ලද මූල්‍ය සමාගම් 6 කින් අයකර ගත් මුළු වාරික මුදල්වල වටිනාකම රු.මිලියන 845.6 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුළු වන්දි ප්‍රමාණය රු. මිලියන 35,243 ක් විය. මුදල් මණ්ඩලය විසින් 2021 වර්ෂයේදී වන්දි මුදල රු. 600,000 සිට රු.1,100,000 දක්වා වැඩිකළ බැවින්, මුදල් සමාගම්වලින් අයකරනු ලබන වාරික මුදල් පිළිබඳ නැවත සලකා බැලීම අවශ්‍ය විය හැකිය. | මෙම ස්වභාවයේ රක්ෂණ යෝජනා ක්‍රමයක් සම්බන්ධව, මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ට ගෙවන ලද වන්දි ප්‍රමාණය, නිශ්චිත මූල්‍ය ආයතනයෙන් අයකර ගත් වාරිකවලට වඩා වැඩිවිය හැකි වීම ස්වභාවික වේ. සියලු සාමාජික ආයතනවලින් අයකරගන්නා වාරික අනුපාතය, රටේ පවතින සාර්ව ආර්ථික පරිසරය ඇතුළු එයට අදාල විවිධ පැතිකඩයන් සලකා බලමින් තීරණය කරනු ලැබේ. ඒ අනුව, වාරික අනුපාත තීරණය කිරීම මෙන්ම ගණනය කිරීමේ ක්‍රමවේදය සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ වරින් වර ගනු ලැබේ. | අවදානම් පාදක වාරික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සලකා බැලීම අවශ්‍ය වේ. |